**පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය - 2021**

**-----------------------------------------------**

**1.** **මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**1.1** **තත්ත්වාගණනය කළ මතය**

**----------------------------**

පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර,අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.මාගේ තත්ත්වාගණනය කල මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**--------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය ( මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම )

-----------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අධිකාරියේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අධිකාරිය ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

---

**1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය**

---

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම් කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

**1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

---

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිතයේ පවතින වත්කම් කාණ්ඩ 5 කට අයත් පිරිවැය රු.166,845,353 ක් වූ වත්කම් වල ඵලදායි ජීවිත කාලය පිළිබඳ වූ ඇස්තමේන්තුව ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශන වල ගැලපීමට කටයුතු කර නොතිබුණි. එසේම එම වත්කම් පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන වල අනාවරණය කර නොතිබුණි. | ඉදිරි වාර්තාකරණ කාල පරිච්ඡේදයේදී ප්‍රමිත 7 හි 65 වගන්තිය ප්‍රකාරව එම වත්කම්වල අවශේෂ වටිනාකම සහ ප්‍රයෝජනවත් ජීවිත කාලය සමාලෝචනය කර ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 3ට අනුව ගිණුම්ගත කිරීමට පියවර ගැනීමට බලාපොරොත්තු වන බව දන්වා තිබුණි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල (රු.) | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| 2021 ජනවාරි 01 ට ලැබිය යුතු දඩ මුදල් වලින් මුදල් ලැබීම් ලෙස ඉවත් කල දඩ මුදල් | 11,389,273 | නඩු අංක හා දඩ මුදල් සහිත විස්තරාත්මක උපලේඛන | 2021 ජනවාරි 01දිනට ලැබිය යුතු දඩ මුදල් ශේෂය දිස්ත්‍රික් වශයෙන් දඩ මුදල් සාරාංශ ගත කොට අදාල ලේඛණ සකස් කර වර්ෂ අවසාන දඩමුදල් ශේෂය ලබා ගැනීම සිදු කර ඇත. | නඩු අංක හා දඩ මුදල සහිතව විස්තර ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. |
| 2021 දෙසැම්බර් 31 ට ලැබිය යුතු දඩ මුදල් වල ඇතුලත් පෙර වර්ෂයන්ට අදාල ලැබිය යුතු මුදල | 247,771 | විස්තරාත්මක ලේඛන | දඩමුදල දිස්ත්‍රික් වශයෙන් දක්වන විස්තරාත්මක උප ලේඛන ඉදිරිපත් කර ඇත. | නඩු අංක හා දඩ මුදල සහිතව විස්තර ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. |
| උපාය දූත මුදල් | 1,650,010 | ශේෂ සනාථන | දිස්ත්‍රික්ක වලට අදාල උපාය දූත මුදල් ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් කරන බව ද දන්වා තිබුණි. | ප්‍රධාන කාර්යාලයේ ඇති උපාය දූත මුදල් පිළිබඳ ශේෂ සනාථන ඉදිරිපත් කිරීමට වගබලා ගත යුතුයි. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16(2) වගන්තිය | 2021 වර්ෂයේ වාර්ෂික මූලා ප්‍රකාශන සමඟ වාර්ෂික කෙටුම්පත් කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කල යුතු වුවත් අධිකාරිය කෙටුම්පත් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2020 වර්ෂයේ වාර්ෂික කෙටුම්පත් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කර තිබුණි. | සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සමග, අදාල වර්ෂයේ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

---------------------

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

-------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 30,227,000 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.1,298,000 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 31,525,000 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාර පුනරාවර්තන ලැබීම් රු.27,704,000 කින් වැඩිවීම හා වර්ෂයේ ක්ෂය රු.11,677,000 කින් අඩු වී තිබීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

--------------------------

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2003 අංක 09 දරන පාරිභෝගික අධිකාරි පනතේ සංශෝධන කටයුතු 2004 වර්ෂයේ ආරම්භ කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විට වසර 17 ක් ගත වී ඇතත් පනත සංශෝධන කටයුතු අවසන් වී නොතිබුණි. | 2003 අංක 09 දරන පාරිභෝගික පනතේ සංශෝධන කටයුතු සිදුකරමින් පවතී. | පනතේ සංශෝධන කටයුතු කඩිනමින් නිම කර ගැනීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කල යුතුය. |

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2003 අංක 09 දරන පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය පනතේ 13 වන උපවගන්තිය යටතේ සමාලෝචිත වර්ෂය තුලදී දිස්ත්‍රික් කාර්යාල හැර අධිකාරියේ පාරිභෝගික පැමිණිලි අංශය වෙත ලද 1557 ක් වූ පැමිණිලි අතුරින් 2021 දෙසැම්බර් 31 දිනට පැමිණිලි 318 ක් සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු නිම වී නොතිබුණි. | මේ වන විට 2021 වසරට අදාළව කටයුතු සිදු කරමින් පවතින විමර්ශන පැමිණිලි වශයෙන් තව දුරටත් පවතින්නේ පැමිණිලි 318 පමණකි. | පාරිභෝගික පැමිණිලි විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුල නීති අංශයේ ලියාපදිංචි කරන ලද පැමිණිලි 1,647 කින් පැමිණිලි 767 කට 2021 දෙසැම්බර් 31 දින වන විට විසඳුම් ලබා දී තිබුණු අතර පැමිණිලි 194 ක් ඉවත් කර තිබුණි. පැමිණිලි 291 ක් සම්බන්ධයෙන් විමර්ශන කටයුතු අවසන් කර නොතිබුණු අතර පැමිණිලි 168 කට නියෝග නිකුත් කර තිබුණද ඉන් පැමිණිලි 14කට අදාලව නියෝග අත්සන් කර නොතිබුණි. එසේම සමාලෝචිත වර්ෂය තුල අධිකාරිය විසින් වැටලීම් 9494 ක් සිදු කර තිබුණු අතර, එය පෙර වර්ෂයේ සිදු කල 15,923 ක් වු වැටලීම් වලට සාපේක්ෂව සියයට 40 ක පහල වැටීමක් වේ. ඉන් සමාලෝචිත වර්ෂය තුල නඩු පවරා තිබුණේ වැටලීම් 6980 කට පමණි. | රටම වසා තිබුණු කාලසීමාව ද ඇතුලත් වූ 2021 වර්ෂයේ වැටලීම් ඉලක්ක ලඟාකර ගැනීමට හැකි පරිසරයක් රටතුල නොපැවතුනු අතර ක්ෂේත්‍ර රාජකාරි සිදු කිරීමේ අපහසුතාද පැවතුණි. එමෙන්ම වසරේ සැලකිය යුතු කාලසීමාවක් අධිකාරියේ කටයුතු ක්‍රියාත්මක නොවීමතුල වැටලීම් වලට වඩා පරීක්ෂා කිරීම හා විමර්ශන කටයුතු සිදු කිරීමට වැඩි අවධානයක් යොමු විය. | පාරිභෝගික පැමිණිලි විමර්ශන කටයුතු කඩිනමින් අවසන් කල යුතුයි. |
| (ඇ) | පාරිභෝගිකයින්ට ක්ෂණික පැමිණිලි ඉදිරිපත් කිරීම සඳහා 1977 දුරකථන සේවාව 2013 වර්ෂයේදී ස්ථාපිත කර තිබුණු අතර 2021 වර්ෂයේ මහජන පැමිණිලි 8,056 ක් ඊට ලැබී තිබුණි.සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පැමිණිලි 2646 ක් සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර වැටලීම් සිදුකර තිබුණේ පැමිණිලි 816 ක් සම්බන්ධයෙන් පමණි. ක්ෂණික ඇමතුම් සේවාව සඳහා ලද පැමිණිලි වලින් දිස්ත්‍රික්ක 07 ක පැමිණිලි සම්බන්ධව ක්‍රියාත්මක වීමේ ප්‍රගතිය සියයට 15 ත් සියයට 53 ත් අතර විය. | 1977 දුරකථන අංකය වෙත ලැබෙන පැමිණිලි විමර්ශනයට ලක් කරන අතර සාර්ථක වැටලීම් ලෙස සඳහන් වන්නේ එසේ සිදු කරනු ලබන විමර්ශනයන්හිදී වැරදි අනාවරණය වූ පැමිණිලි පමණකි. තවත් පැමිණිලි පාරිභෝගික කටයුතු අධිකාරිය පනතෙහි වැරදි ලෙස සඳහන් වැරදි ගණයට නොවැටෙන අවස්ථාද පවතී. මෙවැනි අවස්ථා ගණනාවකදී ස්ථානීය පරීක්ෂණ හා විමර්ශන පමණක් සිදු කිරීමට සිදුවන බව ද සඳහන් කල යුතුයි. | පාරිභෝගික පැමිණිලි විසඳීමේ කටයුතු කඩිනමින් අවසන් කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2021 අගෝස්තු 12 දිනැති අංක 2240/30 දරන ගැසට් පත්‍රය මඟින් රසායනාගාර පරීක්ෂණ සඳහා මිල පාලනය කර තිබුණ ද එම මිල පාලනය පාරිභෝගිකයා අතරට ගිය බවට සමීක්ෂණ කිරීමට දිස්ත්‍රික්ක 02 කින් වැටලීම් 03 ක් පමණක් සිදුකර තිබුණි. | රසායානාගාර පරීක්ෂා සඳහා වැටලීම් 03 ක් සිදු කර තිබුණි. | ප්‍රමාණවත් වැටලීම් සංඛ්‍යාවක් සිදු කිරීමට වගබලා ගත යුතුයි. |
| (ඉ) | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 8 (ඌ) වගන්තිය අනුව වෙළඳපොල තත්ත්ව සහ පාරිභෝගික කටයුතු වලට අදාලව අධ්‍යයන භාර ගැනීම, වාර්තා පළ කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම අධිකාරියේ එක් කර්තව්‍යක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව අධිකාරිය විසින් 2021 වර්ෂයේදී කාබනික කෘෂිකර්ම හා කාබනික නිෂ්පාදන සම්බන්ධයෙන් වර්තමාන තත්ත්වය පිළිබඳ හා වෙළඳපොලෙහි අලෙවි වන විවිධ අත් සේදුම් දියර වර්ග වල අන්තර්ගත ඇල්කොහොල් ප්‍රතිශතය පිළිබඳව සිදුකරන ලද වෙළඳපොල අධ්‍යයන 2 ක් සම්බන්ධයෙන් අනාවරණය වූ කරුණු පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඉදිරියේදී අපනයන සංවර්ධන මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන ජාතික කාබනික පාලන ඒකකය (NOCU) සමග එක්ව පාරිභෝගිකයන් හා අනෙකුත් දේශීය කාබනික වෙළඳාමෙහි සම්බන්ද පාර්ශවයන් දැනුවත් කිරීමට නියමිතව ඇත.අත් සේදුම් දියර සම්බන්ධයෙන් හඳුනා ගත් ගුණාත්මක බැවින් තොරයැයි සැලකෙන නිෂ්පාදන ලැයිස්තුවෙන් සන්නාම 11 ප්‍රමාණයක් වෙළඳපොළෙන් ලබාගෙන කාර්මික තාක්‍ෂණික ආයතනයට (ITI) යවා ගුණාත්මකභාවය පරීක්ෂාකර ඇති අතර ගුණාත්මක බව තහවුරු කිරීමට අපොසත්වී ඇති නිෂ්පාදනයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කර ඇත. ඉදිරියේදී අනෙකුත් නිෂ්පාදන පරීක්ෂාකර ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | වෙළඳපොලෙහි අලෙවි වන විවිධ නිෂ්පාදන පිළිබඳ අනාවරනය වූ කරුණු පිළිබඳ පාරිභෝගිකයා දැනුවත් කිරීම හා ආරක්ෂා කිරීම සඳහා අදාල ක්‍රියාමාර්ග කඩිනමින් ගතයුතු වීම. |
| (ඊ) | පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරී පනතේ 61(3)(ආ) වගන්තිය ප්‍රකාරව යම් භාණ්ඩයක් ප්‍රමිත හා පිරිවිතර වලට අනුකූල නොවන බව සහ ඒ අනනුකූලතාව නිසා අදාල භාණ්ඩය යම් | පරීක්ෂා කර වාර්තා ලබාගැනීම සඳහා වෙළෙඳ අමාත්‍යාංශය විසින් පාරිභෝගික අධිකාරියේ සභාපති | පනත ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රයෝජනයකට ගත නොහැකි හෝ පරිභෝජනය සඳහා නුසුදුසු තත්ත්වයකට පත් වී ඇති බව හෙළිදරව් වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි , ඒ භාණ්ඩය හෝ භාණ්ඩ තොගය තහනමට ගෙන නීතිමය පියවර ගත යුතුය. නියැදි පරීක්ෂාවකට අනුව අනාවරණය වූ ප්‍රමිතයෙන් තොර ටින්මාළු අළෙවි කල කඩහිමියන්ට එරෙහිව පමණක් නඩු පවරා තිබුණු නමුත් එම භාණ්ඩ නිෂ්පාදිත සමාගම් 05 කට එරෙහිව ද නඩු පැවරීමට කටයුතු කර නොතිබුණි. | හරහා යොමු කරන ලද ටින්මාළු සාම්පල 06 න් සාම්පල 05 ක් ප්‍රමිතියෙන් තොර බව වාර්තා අනුව තහවුරු විය. නමුත් එම සාම්පල පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ ක්‍රමවේදය අනුව වෙළෙඳපොලින් ලබාගත් සාම්පල නොවන බැවින් නඩු පැවරීමක් සිදු කිරීමට හැකියාවක් නොමැත. | |
| (උ) | වැටලීම් කිරීම, නඩු පැවරීම හා දඩ අය කිරීම සඳහා දත්ත ගබඩාවක් අධිකාරිය විසින් පවත්වා ගෙන යනු ලබන අතර දත්ත ගබඩාවෙහි ඇතුලත් තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට වූ මුළු දඩ මුදල වන රු.40,711,000 න් තුනෙන් එකක ප්‍රමාණයක් වන රු.13,570,333 ක් 2021 වර්ෂයේ දඩ මුදල් ආදායම ලෙස හඳුනා ගෙන තිබුණි. 2021 වර්ෂයේ දඩ මුදල් ලැබීම් නියැදියක් පරීක්ෂා කිරිමේදී අධිකරණ වලින් අධිකාරියේ අරමුදලට බැර කරන ලද ඇතැම් දඩ මුදල් සම්බන්ධ තොරතුරු දත්ත ගබඩාවේ ඇතුලත් කර නොතිබිම, සහ සමාලෝචිත වර්ෂයේ ආරම්භයේ පැවති ලැබිය යුතු දඩ මුදල් ශේෂයේ ඇතුලත්ව නොතිබුණු දඩ මුදල්, 2019 හා 2020 වර්ෂයන්ට අදාලව ලැබුණු දඩ මුදල් ලෙස ලැබිය යුතු දඩ මුදල් ශේෂයෙන් ඉවත් කර තිබීම යනාදි අඩුපාඩු නිරීක්ෂණය වූයෙන් දත්ත ගබඩාවේ තොරතුරු පදනම් කරගෙන ගණනය කරනු ලබන දඩ මුදල් ආදායමේ නිවැරදිතාවය පිළිබඳ විගණනයට සෑහීමකට පත්විය නොහැකි විය. | මෙම දත්ත පද්ධතියට දඩ මුදල් ආදායම පිළිබඳ විස්තර පමණක් නොව සිතාසි වන නඩු, වරෙන්තු වන නඩු හා අභියායවනා ගොනුකරන නඩු ද ඒවන විට දඩ මුදල් නියම කළ නඩු ද යන ආකාරයෙන් සියලුම වැටලීම් තොරතුරු ඇතුලත් දත්තයන් ඇතුලත් කරයි . කෙසේ වුවද දඩමුදල් දත්ත පද්ධතිය නැවත විස්තරාත්මකව සකස් කරමින් පවතින බැවින් ඉදිරියේදී මෙවැනි සිතාසි වරෙන්තු අභියාවනා නඩු පිළිබඳ විස්තරයක් ද ලබාගත හැකි වනු ඇත. | දඩමුදල් ආදායම නිවැරදිව ගණනය කිරීමට කටයුතු කල යුතුයි. |

| | | | |
|---|---|---|---|
| (ඍ) | වර්ෂය අවසානයේ උපාය දූත මුදල් සම්බන්ධව දිස්ත්‍රික් කාර්යාල වලින් එවන ලද ශේෂ තහවුරු කිරීම් අනුව 2021 දෙසැම්බර් 31 දිනට නඩු පැවරීම් සිදුකර නොතිබූ වැටලීම් වලට අදාල උපාය දූත මුදල් නඩු පැවරීම සඳහා දිස්ත්‍රික්ක වල රඳවාගෙන ඇති අතර ඒ තුල 2010 වර්ෂයේ කරන ලද වැටලීම් වලට අදාල උපාය දූත මුදල් ද පැවතුණි. | අදාල වැටලීමේ නඩු භාණ්ඩ විනාශ වීම මෙන්ම එම කාලයේදී වැටලීම් අධික සංඛ්‍යාව සිදු කලත් අධිකරණ මගින් නඩු භාරගැනීමේ සීමාවන් පනවා තිබීම හේතුවෙන් නඩු පවරා නොතිබුණි. නඩු පැවරිය හැකි වැටලීම් සඳහා හැකි ඉක්මනින් නඩු පවරන ලෙසත් එසේ කල නොහැකි උපායදූත මුදල් ප්‍රධාන කාර්යාලයට බැර කරන ලෙස හෝ පූර්ව අනුමැතිය සහිතව අග්‍රිමයට එකතුකර ගන්නා මෙන් සියලු දිස්ත්‍රික් ප්‍රධානීන් දැනුවත් කර ඇත. | වැටලීම් සඳහා කාලීනව නඩු පැවරීමට කටයුතු කල යුතුයි. |

## 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ අනුමත කාර්ය මණ්ඩලය 667 ක් වන අතර තත්‍ය සේවක සංඛ්‍යාව 520 ක් වූයෙන් පුරප්පාඩු තනතුරු 147 ක් ව පැවතුණි. අධ්‍යකෂ ජනරාල් තනතුරේ වැඩබැලීම සඳහා 2021 අගෝස්තු 02 දින අධ්‍යක්ෂ මුදල් පත්කර තිබුණු අතර මේ දක්වා අධ්‍යකෂ ජනරාල් තනතුර සඳහා ස්ථිර පත්වීමක් සිදුකර නොතිබුණි. එසේම විමර්ශන නිලධාරීන් 450 ක් අනුමත කාර්ය මණ්ඩලය තුල වුවද 357 ක් පමණක් තත්‍ය කාර්ය මණ්ඩලය තුල පැවතිමෙන් 93 ක පුරප්පාඩු පැවතුණ අතර, වසර 2 කට අධික කාලයක සිට මෙම තනතුරු පුරප්පාඩු වී පැවතුණි. | 2021.08.28 දිනැති රාජ්‍ය වියදම් සමාලෝචනය සම්බන්ධව අමාත්‍ය මණ්ඩල සංදේශයේ සේවක බඳවා ගැනීම් සඳහා මූලික කටයුතු සිදුකර තිබුනද මෙතෙක් පත්වීම් කර නොමැති තනතුරු සඳහා බඳවා ගැනීම කල් තිබීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණෙන් අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ බඳවා ගැනීම් කටයුතු ප්‍රමාද කෙරුණි. | වසර 2 කට අධික කාලයක සිට විමර්ශන නිලධාරින් වැනි අත්‍යවශ්‍ය තනතුරු පුරප්පාඩු පැවතුනු බැවින්,බඳවා ගැනීම් සිදු කල යුතුව තිබුණි. |